# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2190/18 - 2020 අගෝස්තු මස 24 වැනි සඳුදා - 2020.08.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

ජනාධිපති විධානය

1. මේජර් ජනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මැතිතුමා
   ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය

2. ලුතිතන් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා මැතිතුමා
   යුධ හමුදාපති

3. එයාර් මාර්ෂල් සුමංගල ඩයස් මැතිතුමා
   ගුවන් හමුදාපති

4. සී.ඩී. වික්‍රමරත්න මැතිතුමා
   වැඩ බලන පොලිස්පති

5. මේජර් ජනරාල් (විශ්‍රාමික) විජිත රවිප්‍රිය මැතිතුමා
   රේගු අධ්‍යක්ෂ ජනරාල්

6. මේජර් ජනරාල් (විශ්‍රාමික) ජගත් අල්විස් මැතිතුමා
   ජාතික බුද්ධි ප්‍රධානී

7. මේජර් ජනරාල් සුරේෂ් සලේ මැතිතුමා
   අධ්‍යක්ෂ, රාජ්‍ය බුද්ධි තොරතුරු සේවාව


1A - G 32747 — 386 (2020/08)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

8. මේජර් ජනරාල් ඒ.එස්. හේවාවිතාරණ මැතිතුමා
අධ්‍යක්ෂ, යුධ හමුදා බුද්ධි අංශය

9. කපිතාන් එස්.ජේ. කුමාර මැතිතුමා
අධ්‍යක්ෂ, නාවික හමුදා බුද්ධි අංශය

10. එයාර් කොමදෝරු එම්.ඩී.ජේ.වාසගේ මැතිතුමා
අධ්‍යක්ෂ, ගුවන් හමුදා බුද්ධි අංශය

11. නියෝජ්‍ය පොලිස්පති ටී.සී.ඒ. ධනපාල මැතිතුමා
පොලිස් විශේෂ කාර්යාංශය

12. නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර මැතිතුමා
අණදෙන නිලධාරී, විශේෂ කාර්ය බලකාය

13. එච්.එම්.ටී.එන්. උපුල්දෙණිය මැතිතුමා
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

වෙත,

ශුභාශිංසන පූර්වකවය !

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, 2020.06.02 වැනි දින දරන ජනාධිපති විධානය මගින් පිහිටුවන ලද සුරක්ෂිත රටක්, විනය ගරුක, ගුණ ගරුක හා නීති ගරුක සමාජයක් ගොඩනැගීම සඳහා වන කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වශයෙන් ඔබතුමන්ලා පත් කරනු ලැබ ඇති හෙයින් ද,

තවද, එකී කාර්ය සාධක බලකායේ සාමාජික, හිටපු නාවික හමුදාපති අද්මිරාල් පියල් ද සිල්වා මැතිතුමා නාවික හමුදාපති ධුරයෙන් විශ්‍රාම ගැනීමෙන් පසු නව නාවික හමුදාපතිවරයෙකු පත්කරනු ලැබ ඇති හෙයින්ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධුරන්ධර ගෝඨාභය රාජපක්ෂ වන මම, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, හිටපු නාවික හමුදාපති වෙනුවට, නව නාවික හමුදාපති, වයිස් අද්මිරාල් නිශාන්ත උළුගෙතැන්න මැතිතුමා, එතුමා ගේ විචක්ෂණභාවය, සාමර්ථ්‍ය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, පූර්වෝක්ත ජනාධිපති විධානය ප්‍රකාරව පිහිටුවනු ලැබූ සුරක්ෂිත රටක්, විනය ගරුක, ගුණ ගරුක හා නීති ගරුක සමාජයක් ගොඩනැගීම සඳහා වන කාර්ය සාධක බලකායේ සාමාජිකයෙක් ලෙස මෙයින් පත් කරමි.

වර්ෂ දෙදහස් විස්සක් වූ අගෝස්තු මස 19 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදි.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

09 - 191

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.